# 10 ශ්‍රේණිය සිංහල සාහිත්‍ය රසාස්වාදය

# කුස ජාතකය

## 02 ඒකකය





සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


{ආදර්ශ ප්‍රශ්න, පසුගිය විභාග ප්‍රශ්න, පළාත් ප්‍රශ්න විචාර සහ පිළිතුරු අන්තර්ගත කර ඒකකය සම්පූර්ණයෙන් ම ආවරණය කර ඇත.}


Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 02. කුස ජාතකය කුරුණෑගල අවධිය

- **විචාර ලිවීමේදී හැඳින්වීම**

✓ කුරුණෑගල රාජධානි සමයේ පාලිජාතකට්ඨකතාව ඇසුරු කරගෙන වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ මැදිහත්වීමෙන් සිංහලයට නැගුණු පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ජාතක කතා 547කින් සමන්විතය. එය කතා 550ක්ව පැවති බවට ද විද්වත් මතයක් පවතී. එහි එන 523වන කතාංගය වන කුස ජාතකය ස්ත්‍රියක් නිසා සසුනේ උකටලී වූ එක්තරා භික්ෂුවක් උදෙසා බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. ස්ත්‍රීන් පිළිබඳ සිත් නිසා තේජස්වූ පුරාතනයේ නුවණත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යසනයට පැමිණීම මින් විදහා දක්වයි.

- **අදර්ශ විචාර ප්‍රශ්න**

1. කුස ජාතකයේ එන ඔක්කාන රජුගේ චරිතය පිළිබඳ විචාරයක් ලියන්න. (ලකුණු 15)
2. කුස ජාතකය ශ්‍රාවකයාගේ සිත් තුළ හාස්‍ය රසය ජනනය කරන කතා වස්තුවකි. නිදසුන් තුනක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)
3. සැබෑ ලෝකයේ කාන්තාවකගේ චිත්ත ස්වභාවය පබාවතියගේ චරිතයෙන් නිරූපණය වෙයි. නිදසුන් තුනක්වත් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)
4. ජාතක කතාකරුවා මිනිසුන්ගේ ගූඪ සිතුවිලි දැන හැඳින ඒවා පාඨකයා හමුවේ ඉදිරිපත් කර ඇති ආකාරය කුස රජුගේ චරිතය ඇසුරෙන් විමසුමට ලක් කරන්න. (ලකුණු 15)
5. කුස ජාතකයෙන් නිරූපණය වන්නේ සරාගී සිතුම් මිස පිවිතුරු සෙනෙහස නොවේ. කතා පුවත ඇසුරෙන් විමසන්න. (ලකුණු 15)
6. කුස ජාතක කතාවේ ප්‍රබල සංකල්ප රූප මැවෙන අවස්ථා තුනක් විමසන්න. (ලකුණු 15)
7. ජාතක කතාකරුවා කුස ජාතකය රසවත් ව ඉදිරිපත් කිරීම සඳහා භාෂාව හසුරුවා ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 15)
8. ජාතක කතාකරු පබාවතිය කෙරේ පාඨක සිත් තුළ උපහාසය ජනනය කළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 15)
9. කුස ජාතකය කියවන විට දී හෝ අසා සිටින විට දී අපූර්ව වාග්චිත්‍ර මැවීම එම කතා පුවතේ විශේෂත්වයකි. එවන් අවස්ථා තුනක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 15)

- **ආදර්ශ උදෘත**

✓ ''අගමෙහෙසුන් වූ සීලවතී දේවීන් වහන්සේ සීලාචාර සම්පන්න සේක. උන් වහන්සේ රැකවලින් හළ මැනව. දරු කෙනෙක් ඇති වෙත'' කී සඳ රජ්ජුරුවෝ එබස් පිළිගෙන නුවර වැසියන් රැස් කරවා සීලවතී දේවීන්වහන්සේ සර්වාභරණයෙන් සරසා මාලිගාවෙන් පිටත් කළාහු ය.

✓ ''සැබව, දේවයන් වහන්ස, අධර්මකාරී කෙනෙක් නැත. වංශ පරිපාලනය කරන්ට නිසි දරු කෙනෙක් නැත්තාහ. අනික් කෙනෙක් අප රාජ්‍යය ඇරගෙන අධර්මයෙන් රාජ්‍යය නසති.''

✓ ''ඔක්කාක රජ්ජුරුවෝ ගොස් කුසාවතී නුවර දිව්‍යපුරයක් මෙන් සරසා බන්ධනගත සියලු සත්ත්වයන් මුදා හරවා පුතණුවන්ට ප්‍රභාවතීන් අග මෙහෙසුන් කොට අභිෂේක කරවා කුස රජ්ජුරුවන්ගේ ආඥාව යයි අණබෙර ලවා සේසත් නැංවූහ.''

✓ ''දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ තුන් වැදෑරුම් වූ නාටක සත්‍රීන්ගෙන් පළමු කොට රැකවල් ඇති ව පිටත ඉන්නා වූ සුළු නළු මුළු රැකවල් හැර ස්ත්‍රීන් සිත සේ ඇවිදනාව හැර වදාළ මැනව. ඉදින් ඉන් එක් කෙනෙක් දරු කෙනෙකුන් ලද්දා නම් මැනව. නැත්නම් ඉක්බිති අගමෙහෙසුන් බිසවුන් වහන්සේ හැර අවශේෂ ස්ත්‍රීන් හළ මැනව. ඒකාන්තයෙන් මෙතෙක් දෙනා අතුරෙන් කුසල් ඇති කෙනෙක් දරු කෙනෙකුන් ලබති'' යි කීවාහු ය.

✓ ''කුමක් නිසා මට නින්දා කරවු ද ශරීරය ජරප්‍රාප්ත පමණක් විනා රාගය තරුණ වන්නේ ය. ඉදින් සීලවතී දේවීන් ලදින් නම් ගෙන යෙමි යි සිතා ආමි''

- ✓ ''මේ නො කීකරු දරුවෝ අප පැනට එවා තුමූ මේ වේලෙ පළමු කොට අවුදින් මෙතන සිටියෝ ය. රජකුලයට පරිභව උපදවන්නා වූ කෙල්ල, ඉදින් රජ්ජුරුවන් වහන්සේ දත් සේක් වී නම් අප හැම නසා පියන සේකැ''යි කියා කිපී කොපුලතෙහි පහරක් ගැසුව.
- ✓ ''මම මෙතැන් පටන් දිවිහිමියෙන් කයින් වචසින් මනසින් අමනාපයක් නො සිතමි, නො කරමි ඉදින් මා මෙසේ යාඥා වෙමින් සිටිය දී මට ක්ෂමා නො කොට මාගේ බස් නො පිළිගත් සේක් වී නම් දැන් මපියාණන් වහන්සේ මෙසත් රජදරුවන්ට මා සත් කඩක් කොට කපා දෙන සේක. එහෙයින් මට ක්ෂමා කොට රැක්ක මැනවැයි යාඥා කළා ය.''

- **<u>පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - කෙටි ප්‍රශ්න</u>**

1. ''දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනි ව වැඩ සිටි හෙයින් වැද්ද නොහෙමි''

   I. මේ ප්‍රකාශය කෙළේ කවරෙක් ද?
   II. මෙහි බිසවුන් වහන්සේ යනුවෙන් හැඳින්වූයේ කවුරුන් ද? (2021 Pho. o/L)

2. ''පිටිපස්සේ වුන් ඇත් ගොව් ඉතාම චපලය, මට උසුළු විසුළු පෑයේ ය.''

   I. මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දේ ද ?
   II. මෙහි ඇත්ගොව්වා ලෙස පෙනී සිටියේ කවරෙක් ද ? (2019 o/L)

3. '' මූ යන්ට අවසර නොලද්දු නම් ළය පැලී මිය යන්නාහ. දැනට යෙත්ව.''

   I. මෙහි 'මූ' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද ?
   II. මෙම ප්‍රකාශය කරන ලද්දේ කුමන අවස්ථාවක ද ? (2018 o/L)

4.

   I. පන්සිය පනස් ජාතක පොත කිනම් සාහිත්‍යය යුගයේ රචනා වූවක් ද?
   II. පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍රය වී ඇත්තේ කුමක් ද? (2017 o/L)

5. '' තොපට වරදානයක් දෙමි, කැමති වරයක් ඉල්වා ගනැ''යි කීහ.

   I. මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද ?
   II. මෙහි ' තොපට' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කාටද?

   (2016 o/L)

6. '' මෑ සත් කඩක් කොට කපා රජ දරුවන් සත් දෙනාට දී පියා ගැලවෙම්ව''

   I. මෙහි 'මෑ' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද ?
   II. මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද ?

   (2020 o/L)

- **<u>පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - ව්‍යුහාත්මක ප්‍රශ්න</u>**

**1.** පහත දැක්වෙන ගද්‍ය කොටස කියවා පිළිතුරු සපයන්න. (2021 Pho. o/L)

ඉක්බිති රජ්ජුරුවෝ බිසවුන් ගිවිස්වමින් "දේවීනි, ප්‍රභාවතීන් කපා නො දී අනික් කුමක් කරවු ද, තොපගේ දියණියෝ සියලු දඹදිවට අග්‍ර රජ්ජුරුවන් විරූප යයි හැර පියා ගිය මහ එම පිය නො මැකෙන තෙක් මරණ නළල තිබා ගෙන අවු ය. දැන් තමාගේ රූ නිසා කරන ලද ඊර්ෂ්‍යාවෙහි විපාක ලබන්නී වේ දැ"යි කීහ.

එබස් අසා බිසෝ දියණියන් ළඟට ගොස් අඬමින් වලපමින් "දියණියෙනි තොපට අමනාපයක් සිතිනුත් නො සිතන්නා වූ මාගේ බස් නො ගිවිස තොප දැන් ලේ පෙර පෙරා සත්කඩක් කොට කපා මේ රජදරුවන්ට දෙන ලදුව යමපුරයට යන්නී වේ ද. තව ද මේ ලෝකයෙහි යම් සත්වයෙක් වැඩෙහි හැසිරෙන හිතේෂීන්ගේ කීම නො කරන්නේ ද එතෙම මෙබඳු වූ දුක්කම්කටුළු ලදුව නොයෙක් අනය ව්‍යසනයට ද පැමිණෙන්නේ ය. තව ද රන්කමින් උදුල මාණික්‍ය මේඛලාදාමයෙන් විරාජමාන වූ ප්‍රභාවතීනි, ඉදින් තමාගේ සිත් පස්සේ නො ගොස්, උභයකුල පරිශුද්ධ අසම්භින්න සූර්යවංශප්‍රසූත ශෞර‍වීර්යවික්‍රමසමන්විත කුස රජ්ජුරුවන් හා එක්ව තොප හා සමාන රූපශ්‍රීන් ඇති දැකුම් කටයුතු වූ කුමාර කෙනෙකුන් ලද හොත් අප ඇම ඇතුළු වූ බොහෝ ඥාතිවර්ගයා විසින් සත්කාර සම්භාවනා කරන ලදුව සියලු දුක් දුරුකොට බොහෝ දවසක් සැප සේ වාසය කරන්නී වේ ද"

I. මේ උද්ධෘතය ඇසුරෙන් ඉස්මතුවන පබාවතියගේ චරිත ලක්ෂණ දෙකක් ලියන්න.
II. කුස ජාතක කතුවරයා අපූර්වත්වයෙන් භාෂාව හසුරුවා ඇති ආකාරය ඇඟවෙන නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න.
III. රාජ්‍ය පාලනයේදී රජතුමා කටයුතු කළ ආකාරය මෙම පාඨය ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න.
IV. මෙහි දැක්වෙන පරිදි තම දියණිය මුහුණ දෙන අවාසනාවන්ත සිදුවීම් හමුවේ සංවේගයට පත් වන මවකගේ ස්වරූපය හෙළි කෙරෙන නිදසුන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

**2.** පහත දැක්වෙන ගද්‍ය කොටස කියවා පිළිතුරු සපයන්න. (2019 o/L)

''තව ද ප්‍රභාවතීනි කුසරජ්ජුරුවන්ගේ යම් ගෘහෝද්‍යාන විද්‍යුල්ලතා සශ්‍රීක ව විරාජමාන වූ ස්වර්ණමයූර රාජයන් විසින් මිහිඟු බෙර හඬින් මත් ව පවත්වන ලද කෙකානාදයෝ කොස්ලිහිණියන් විසින් පවත්වන ලද අනුරාගයෙන් හරිත වේ ද, එබඳු වූ ශ්‍රී සෞභාග්‍යය හා ඓශ්වර්ය විශේෂ ඇති ඒ කුසාවතී රාජධානියෙහි ඉසුරු හැර ඊට වඩා කවර සැපයෙක් කොයි ඇති හෙයින් මීට අවුද'' යනාදීන් ප්‍රභාවතීන්ට අවවාද වශයෙන් කුසාවතියෙහි විභූතිය වර්ණනා කොට ඉදින් ඒ කුස රජ්ජුරුවෝ අද මෙතන වී නම් මේ සත්රජදරුවන් මරා ලුහුබඳවා මාගේ දියණියන්ට පැමිණි මේ දුක් දුරුකොට කැඳවා ගෙන යන්නෝ වේ ද, කපුටු රැසක් කැටක් ගසා පලවා ලන්නාක් මෙන් තමන්ගේ වචන මාත්‍රයකින් ම සකල ශත්‍රු මර්දනය කරන්නා වූ ඉදින් සිතුව හොත් එක් සියක් රාජධානීනුත් හැර ගන්ට නිසි වූ සමර්ථ ඇති විශිෂ්ට වූ ප්‍රඥානුභාව ඇති ඒ කුස රජ්ජුරුවෝ අද මෙනුවර වූ නම් අප හැමට පැමිණි මේ දුකින් ගලවා ගන්නාහු යයි යනාදීන් කුස රජ්ජුරුවන්ගේ බොහෝ ගුණ කථනය කළාහු ය.

එකල්හි ප්‍රභාවතී තොමෝ "කුස රජ්ජුරුවන්ගේ ගුණ කියන්නා වූ මාගේ මෑණියන් වහන්සේගේ මුඛ නො සෑහෙන්නේ ය. එහෙයින් උන් වහන්සේ අරක්කැමි කොට මේ ගම වසන බව මෑණියන් වහන්සේට කියම්"යි සිතා "මෑණියන් වහන්ස, අනන්‍ය සාධාරණගුණගණාභරණවිභූෂිත ශෞර‍වීර්යබලපරාක්‍රමප්‍රතාපප්‍රඥාගුණ ඇති මේ සතුරන් නසා අප හැම රකින්ට නිසි වූ කුසරජ්ජුරුවන් වහන්සේ අපට ආළාරිකව මෙතන ම වාසය කරන සේක. උන් වහන්සේ කැඳවම්දැ''යි විචාළා ය.

ඉක්බිති "ප්‍රභාවතීනි, මරණභයින් පීඩිත ව නන්දොඩ වූ ද, අඥානයෙන් මූඪ වූ ප්‍රලාප දොඩවූ ද, බොලඳකමින් කිව මනා දෙය තබා අනිකක් කියවූ ද තොප මේ කියන්නේ කිම් ද ඒ කුස රජ්ජුරුවෝ ඉදින් මේ නුවරට අවු නම් අපට නො දැනෙන්ට කාරණා කිම් ද ඉදින් එත් නම් අපට කියා එවා තමන්ගේ සේනාවාහනයන් පිරිවරා නේත් ද, මෑගේ කුමන නන් දෙඩීමෙක් ද'' යනාදීන් දෙඩූ ය.

එසඳ ප්‍රභාවතී මෑණියන් වහන්සේ කුමක් කීවත් අදහා නො ගන්නා සේක. ප්‍රත්‍යක්ෂයෙන් දක්වාලා කියමී සිතා මෑණියන්ගේ අත අල්වා ගෙන මතු මාල්තලයට නැගී ගොස් සීමැදුරු කවුළුව හැර පිටත බලා වළන් සෝධමින් සිටි බෝධිසත්ත්වයන් දිසාවට අත දිගු කොට "මෑණියන් වහන්ස, තෙලෙ කුමාරිකාවරුන්ගේ අන්තඃපුර ආසන්නයෙහි මුළුතැන්ගෙයි මිදුලෙහි තරයේ කැසපට ගන්වා අරක්කැමි වේශයෙන් නැඹුරුව සිට වළන් සෝධන සේක් කුස රජ්ජුරුවන් වහන්සේ'' යයි දැන් වූ ය.

එකල බෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන් නිසා සත්රජ්ජුරු කෙනෙක් මෙ නුවර වටලා ගත්තාහ යි යනු අසා අද දවස් මාගේ මනෝරථය මුදුන් පැමිණෙන්නේ යයි මාගේ මේ ගමට ආ නියාව අද දවස් ප්‍රභාවතී දෙමවුපියන්ට කියන්නී ය, ඒ අසා මා ගෙන්වා ගෙන උන් මට පාවා දෙති, එකල මා ගත් දුක් සාර්ථක වන්නේ යයි වළන් සෝධා තැන්පත් කොට තබම් සිතා පැන් ගෙනවුත් වළන් සෝධන්ට පටන්ගත්හ, එසඳ වළන් සෝධමින් සිටි රජ්ජුරුවන් දැක දියණියන්ට උරණව "කෙල්ල, තෝ චණ්ඩාල

එකක් ද, අවශේෂ හීන ජාතියෙහි එකක් ද නොහොත් මෙබඳු රාජ වංශය නසන්ට උපන් එකක් ද මදු රජ කුලයෙහි උපන් තෝ සකල රාජ මෞලිමාණික්‍යකාන්තීන් බබළන ලද පාදපීඨ ඇති තොපගේ වල්ලභ වූ කුස රජහු ලවා දාස ක්‍රියා කරවී දැ''යි පරිභව බිණු ය.

I. කුස රජතුමා සාගල පුරයට පැමිණ සිටි බව පබාවතියගේ මව දැන සිටියේ යැයි පූර්වොක්ත ඡේදයෙන් කියැවේ ද?
II. දඹදිව සියලු රජ දරුවන් කුස රජතුමාගේ දෙපා බන්ධනය කළ බව කියැවෙන අවස්ථාව ඡේදයෙන් උපුටා දක්වන්න.
III. තම අභිමතාර්ථය සාධනය වන බව කුස රජු දැනගත්තේ කෙසේ ද?
IV. කුස රජතුමාගේ බලපරාක්‍රමය වර්ණනා කර ඇති ආකාරය මෙම ඡේදය ඇසුරින් පැහැදිලි කරන්න

**3.** පහත දැක්වෙන ගද්‍ය කොටස කියවා පිළිතුරු සපයන්න. (2017 o/L)

''එකල නුවර වැස්සෝ හා රාජ්‍ය වාසීහු හා පුරදොරට රැස්ව රට නස්නේ ය විනස්නේ යයි මහත් කොට කෝලාහල කළාහු ය. ඒ කෝලාහල ඇසූ රජ්ජුරුවෝ සීමැදුරු කවුළුව හරවා "මා රාජ්‍ය කරමින් සිටිය දී අන්‍යායක් කරන කෙනෙක් නැත්තාහ. කුමක් නිසා මොරගවුදැ''යි විචාළහ.

එකල ඔවුන් විසින් "සැබව, දේවයන් වහන්ස, අධර්මකාරී කෙනෙක් නැත. වංශ පරිපාලනය කරන්ට නිසි දරු කෙනෙක් නැත්තාහ. අනික් කෙනෙක් අප රාජ්‍යය ඇරගෙන අධර්මයෙන් රාජ්‍යය නසති. ඒ කාරණයෙන් දැහැමෙන් රාජ්‍යය කරන්ට නිසි පුතණු කෙනෙකුන් පැතුව මැනවැ''යි කීහ. එසඳ රජ්ජුරුවෝ ද දරුවන් ප්‍රාර්ථනා කරන්නා වූ මා විසින් කුමක් කටයුතු දැයි විචාළාහු ය. "දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ තුන් වැදෑරුම් වූ නාටක ස්ත්‍රීන්ගෙන් පළමු කොට රැකවල් ඇති ව පිටත ඉන්නා වූ සුළු නළු මුළු රැකවල් හැර ස්ත්‍රීන් සිත සේ ඇවිදනාව හැර වදාළ මැනව. ඉදින් ඉන් එක් කෙනෙක් දරු කෙනෙකුන් ලද්දා නම් මැනව. නැත්නම් ඉක්බිති අගමෙහෙසුන් බිසවුන් වහන්සේ හැර අවශේෂ ස්ත්‍රීන් හළ මැනව. ඒකාන්තයෙන් මෙතෙක් දෙනා අතුරෙන් කුසල් ඇති කෙනෙක් දරු කෙනෙකුන් ලබති''යි කීවාහු ය. එකල රජ්ජුරුවෝ ඔවුන්ගේ බසින් එලෙස කරවාත් දරු කෙනෙකුන් නො ලදින් නො සතුටු වූහ.

I. මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයටට නුවර වැස්සෝ කෝලාහල කළේ කුමන කරුණු අර අරභයා ද?
II. නුවර වැස්සන් විසින් කෝලාහල කරන ලද්දේ කුමන කාරණා පවසමින් ද?
III. මේ පාඨයෙහි සඳහන් වන ආකාරයටයට දරු කෙනෙකුන් ලබන්නේ කවර කෙනෙක් ද?
IV. දරුවන් ප්‍රාර්ථනා කරන්නා වූ රජතුමාට නුවර වැසියන් විසින් දෙනු ලැබූ උපදේශය කුමක්දැයි පැහැදිලි කරන්න.

- <u>**පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - රචනා ප්‍රශ්න**</u>

1. "විරූපී භාවය නිසා පසුතැවිල්ලට පත් වූ පුද්ගලයෙකුගේ ලක්ෂණ කුස චරිතයෙන් නිරූපණය කෙරෙයි" කුස ජාතක කථාවෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න.

(2021 Pho. o/L)

2. ජාතක කතා කතුවරයාගේ අවස්ථා නිරූපණ හැකියාව කුස ජාතකය ඇසුරෙන් නිදසුන් තුනක්වත් දෙමින් අගයන්න.

(2020 o/L)

3. කුස කුමරු තමන් හමුවේ ඇති අභියෝග ජය ගැනීම සඳහා කටයුතු කළ ආකාරය නිදසුන් සහිත ව විස්තර කරන්න.

(2018 o/L)

4. කුස ජාතකය චිත්තරූප දනවන අන්දමේ ජාතක කථාවක් බවට පත්වීමෙහි ලා එහි භාෂාව උපයෝගී වී ඇති ආකාරය නිදසුන් **තුනක් වත්** ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(2016 o/L)

- **පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - කෙටි ප්‍රශ්න - පිළිතුරු**

1. i) ස්වර්ණකාරයා/ තරාල ඇදුරා ii) රන්රුවට ( ලකුණු 04)
(2021 Pho. o/L)

2. i) ප්‍රභාවතිය / පබාවතී / පබාවතී කුමරිය
ii) කුස රජු / කුස කුමාරයා ( ලකුණු 04)
(2019 o/L)

3. i) පබාවතී බිසව/ කුස රජුගේ බිසව/ මදු රද දූ/ ප්‍රභාවතී/පබාවතී
ii) මඟුල් උයනේදී පොකුණේදී කුස රජු විරූපී අයෙකු බව නිශ්චිත ව හඳුනාගත් පසු පබාවතිය නැවත මදු රටට යන්නට යාන වාහන සරසන ලෙස තමන්ට නියෝග කළ බව ඇමතිවරුන් විසින් කුස රජුට පවසන ලද අවස්ථාව ( ලකුණු 04)
(2018 o/L)

4. i) කුරුණෑගල අවධිය
ii) “පාලි ජාතකට්ඨ කථාව” ( ලකුණු 04)
(2017 o/L)

5. i) ශක්‍ර දේවේන්ද්‍රයෝ
ii) සීලවතී දේවී/ සීලවතී බිසව ( ලකුණු 04)
(2016 o/L)

6. i) පබාවතී බිසව/ කුස රජුගේ බිසව/ මදු රද දූ/ ප්‍රභාවතී/පබාවතී
ii) මදු රජ්ජුරුවෝ ( ලකුණු 04)
(2016 o/L)

- **පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - ව්‍යුහාත්මක ප්‍රශ්න - පිළිතුරු**

2.
I. නැත. දැන සිටි බව ඡේදයෙන් නොකියවේ. ( ලකුණු 05)

II. “සකල රාජ මාලිගා කාන්තියෙන් බබලන ලද පාද පාදපීඨ ඇති තොපගේ වල්ලභ වූ කුස රජහු” ( ලකුණු 05)

III. රජවරුන් සත් දෙනෙකු පබාවතිය ලබාගැනීම වෙනුවෙන් සාගල නුවර වටලා ගත් අවස්ථාවේ ඔවුන්ගෙන් ගැලවීම සඳහා තමාගේ පිහිට පැතීමට මදු රජුට සිදු වන බව කුස රජු අවබෝධ කර ගත්තේය. එමගින් තම අභිමතාර්ථය එනම් පබාවතිය නැවත දිනා ගැනීම සාර්ථක වන බව කුස රජු දැනගත්තේ ය. ( ලකුණු 05)

IV. රජුගේ බල පරාක්‍රමය දැක්වීම සඳහා පබාවතීගේ මෑණියන් විසින් කුසාවතී පුරයෙහි ශ්‍රී සෞභාග්‍ය සහ ඓශ්වර්ය පිළිබඳ කෙරෙන වර්ණනය.
රජදරුවන් පලවා හැරීම කපුටු රැසක් වැටක් ගසා පන්නා දැමීම වැනි පහසු කටයුත්තක් බව සඳහන් කිරීම.
පබාවතිය සිය මෑණියන්ට කුස රජතුමා තම මාලිගයේ වාසය කරන බව දැන්වීමේ දී රජතුමා පිළිබඳ කරන වර්ණය.
දඹදිව සියලු රජුන් කුස රජුගේ පාද වන්දනාවේ යෙදෙන බවට පබාවතීගේ මෑණියන් විසින් කරනු ලබන වර්ණය.
සාර්ථක පිළිතුරකට අදාළ කොටස් උපුටා දක්වා තිබීම අවශ්‍ය වේ ( ලකුණු 10)

(2019 o/L)

## 01. කුස ජාතකයේ එන ඔක්කාක රජුගේ චරිතය පිළිබඳ විචාරයක් ලියන්න. (ලකුණු 15)

කුරුණෑගල රාජධානි සමයේ පාලිජාතකට්ඨකතාව ඇසුරු කරගෙන වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ මැදිහත්වීමෙන් සිංහලයට නැගුණු පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ජාතක කතා **547**කින් සමන්විතය. එය කතා **550**ක්ව පැවති බවට ද විද්වත් මතයක් පවතී. එහි එන **523**වන කතාංගය වන කුස ජාතකය ස්ත්‍රියක් නිසා සසුනේ උකටලී වූ එක්තරා භික්ෂුවක් උදෙසා බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. ස්ත්‍රීන් පිළිබඳ සිත් නිසා තේජස්වූ පුරාතනයේ නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යසනයට පැමිණීම මින් විදහා දක්වයි.

එහි එන ඔක්කාක රජු මලල රට කුසාවතී නුවර විසූ දසරාජ ධර්මයෙන් දැහැමින් රාජ්‍ය කළ යහපත් රජ කෙනෙකි. ඔහු ප්‍රජාතන්ත්‍රවාදී රජ කෙනෙකු බව මීළඟ රාජ්‍ය පාලනය සඳහා රාජ කුමාරයෙකු අවශ්‍ය බව පවසා රට වැසියන් සිදු කරන කෝලාහලයේදී පැහැදිලි වේ. රට වැසියන්ගේ යෝජනාවට අනුව රජු තම නාටක ස්ත්‍රීන් රැකවල්වලින් නිදහස් කර පසුව පුරංගනාවන් ද අවසානයේ තම අගබිසව වන සීලවතී බිසව පවා නිදහස් කිරීමට පෙළඹේ.

> **"අගමෙහෙසුන් වූ සීලවතී දේවීන් වහන්සේ සීලාචාර සම්පන්න සේක. උන් වහන්සේ රැකවලින් හළ මැනව. දරු කෙනෙක් ඇති වෙත" කී සඳ රජ්ජුරුවෝ එබස් පිළිගෙන නුවර වැසියන් රැස් කරවා සීලවතී දේවීන්වහන්සේ සර්වාභරණයෙන් සරසා මාලිගාවෙන් පිටත් කළාහු ය.**

රජුගේ ඉවසීම ප්‍රජාතන්ත්‍රවාදී ගුණය ආදිය මින් පැහැදිලි වන අතර ඔහු ඉතා යහපත් පාලකයෙකු වේ. එය මහජනයා විසින් කරන ප්‍රකාශ වලින්ම පැහැදිලි වන අතර මහජනතාවද රජුගේ පාලනයට දැක්වූ සහයෝගය මෙන්ම රජු කෙරෙහි තිබුණු පක්ෂපාතී බවද ඉන් පැහැදිලි වේ.

> **"සැබව, දේවයන් වහන්ස, අධර්මකාරී කෙනෙක් නැත. වංශ පරිපාලනය කරන්ට තිසි දරු කෙනෙක් නැත්තාහ. අනික් කෙනෙක් අප රාජ්‍යය ඇරගෙන අධර්මයෙන් රාජ්‍යය නසති."**

මෙලෙස ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශී පාලනයක් ගෙන යන ඔක්කාක රජු තම පුතණුවන් වූ කුස කුමරුට සුදුසු කාලයේදී රජ්‍ය පාලනය ලබා දෙයි.

> **"ඔක්කාක රජ්ජුරුවෝ ගොස් කුසාවතී නුවර දිව්‍යපුරයක් මෙන් සරසා බන්ධනගත සියලු සත්ත්වයන් මුදා හරවා පුතණුවන්ට ප්‍රභාවතීන් අග මෙහෙසුන් කොට අභිෂේක කරවා කුස රජ්ජුරුවන්ගේ ආඥාව යයි අණබෙර ලවා සේසත් නැංවූහ."**

ඔක්කාක රජු පරමාදර්ශී පාලකයෙකු වන්නේ මහජන මතයට ගරු කිරීමත් ධාර්මික ව රට පාලනය කිරීමත් නිසාය. නූතන සමාජයට ඔක්කාක රජුගේ ආදර්ශය ඉතා වැදගත්ය. ආත්මාර්ථය පෙර දැරි කරගත් පාලකයන්ට වඩා ඔක්කාක රජු ශ්‍රේෂ්ඨ වන්නේ මේ නිසාය. මහජන මතයට සවන් දුන් නිසා ඔහුත් රටත් ආරක්ෂා වූ බවත් ඉතා බුද්ධි සම්පන්න කුස කුමරු රජුට ලැබුණු බවත් තිසි කල පුත් කුමරුන්ට රට භාර දීමත් කතා පුවතෙන් තහවුරු වේ.

Hasitha hettiarachchi
071-9020298

**02. කුස ජාතකය ශ්‍රාවකයාගේ සිත් තුළ හාස්‍ය රසය ජනනය කරන කතා වස්තුවකි. නිදසුන් තුනක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)**

කුරුණෑගල රාජධානි සමයේ පාලිජාතකට්ඨකතාව ඇසුරු කරගෙන වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ මැදිහත්වීමෙන් සිංහලයට නැගුණු පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ජාතක කතා **547**කින් සමන්විතය. එය කතා **550**ක්ව පැවති බවට ද විද්වත් මතයක් පවතී. එහි එන **523**වන කතාංගය වන කුස ජාතකය ස්ත්‍රියක් නිසා සසුනේ උකටලී වූ එක්තරා භික්ෂුවක් උදෙසා බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. ස්ත්‍රීන් පිළිබඳ සිත් නිසා තේජස්වූ පුරාතනයේ නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යසනයට පැමිණීම මින් විදහා දක්වයි.

ජාතක කතාවේ සීලවතී බිසවගේ කුසයේ ගැබක් පිහිටීම උදෙසා රටවාසීන් විසින් කරන ලද යෝජනාව ජාතක කථාවේ ආරම්භයේදීම ශ්‍රාවකයා තුළ හාස්‍ය රසයක් ජනනය කරයි.

> **"දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ තුන් වැදෑරුම් වූ නාටක ස්ත්‍රීන්ගෙන් පළමු කොට රූකවල් ඇති ව පිටත ඉන්නා වූ සුළු නළු මුළු රූකවල් හැර ස්ත්‍රීන් සිත සේ ඇවිදනාව හැර වදාළ මැනව. ඉදින් ඉන් එක් කෙනෙක් දරු කෙනෙකුන් ලද්දා නම් මැනව. නැත්නම් ඉක්බිති අගමෙහෙසුන් බිසවුන් වහන්සේ හැර අවශේෂ ස්ත්‍රීන් හළ මැනව. ඒකාන්තයෙන් මෙතෙක් දෙනා අතුරෙන් කුසල් ඇති කෙනෙක් දරු කෙනෙකුන් ලබති"යි කීවාහු ය.**

සියළු පහත් ස්ත්‍රීන් නිදහසේ ඇවිද ගොස් දරුගැබක් සාදාගෙන පැමිණීමට ක්‍රියා කිරීම, පසුව එය අසාර්ථක වූ විට අග බිසව හැර අවශේෂ ස්ත්‍රීන් පිටත් කර හැරීම ආදිය ශ්‍රාවකයාගේ සිත් තුළ ඇති කරන හාස්‍ය රසය තව දුරටත් වර්ධනය වන්නේ අවසානයේ සීලවතී බිසවද එලෙස පිටත් කර හැරීමට කරන ලද යෝජනාවෙනි. එය ඔක්කාන රජුගේ දුබලතාවයද ව්‍යංගාර්ථයෙන් නිරූපණය කරයි.

ශක්‍ර දේවේන්ද්‍රයා විසින් සීලවතී බිසව නින්ඩාවෙන් ගලවා ගැනීම සඳහා මහලු බමුණෙකු මෙන් වෙස්වලාගෙන මාළිගාවට පැමිණෙන අතර එහිදී කරන ලද පහත ප්‍රකාශයෙන් ද ශ්‍රාවකයා තුළ හාස්‍ය රසයක් ජනනය වේ.

> **"කුමක් නිසා මට නින්දා කරවු ද ශරීරය ජරප්‍රාප්ත පමණක් විනා රාගය තරුණ වන්නේ ය. ඉදින් සීලවතී දේවීන් ලදින් නම් ගෙන යෙමි යි සිතා ආමි"**

පැන් පිණිස යන කුදිය පබාවතී යැයි රූවටී රන් රුවට පහරක් ගසා අනෙහී වේදනාවට පත්වීම හාස්‍ය රසය ජනනය කරන තවත් අවස්ථාවකි.

> **"මේ තො කීකරු දරුවෝ අප පැනට එවා තුමූ මේ වේලෙ පළමු කොට අවුදින් මෙතන සිටියෝ ය. රජකුලයට පරිභව උපදවන්නා වූ කෙල්ල, ඉදින් රජ්ජුරුවන් වහන්සේ දත් සේක් වී නම් අප හැම නසා පියන සේකැ"යි කියා කිපී කොපුලතෙහි පහරක් ගැසුව.**

එලෙසම දරුවෙකු පිළිසිඳ ගන්නා තෙක් දිවාකල්හි ස්වාමියා නොදැක සිටීමේ චාරිත්‍රයක් ඇති බවට සීලවතී බිසව කරන ප්‍රකාශය ආදී හාස්‍ය රසය ජනනය කරන අවස්ථා රැසක් කුස ජාතකය තුළ හමු වේ.

Hasitha hettiarachchi
071-9020298

## 03. සැබෑ ලෝකයේ කාන්තාවකගේ චිත්ත ස්වභාවය පබාවතියගේ චරිතයෙන් නිරූපණය වෙයි. නිදසුන් තුනක්වත් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

කුරුණෑගල රාජධානි සමයේ පාලිජාතකට්ඨකතාව ඇසුරු කරගෙන වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ මැදිහත්වීමෙන් සිංහලයට නැගුණු පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ජාතක කතා **547**කින් සමන්විතය. එය කතා **550**ක්ව පැවති බවට ද විද්වත් මතයක් පවතී. එහි එන **523**වන කතාංගය වන කුස ජාතකය ස්ත්‍රියක් නිසා සසුනේ උකටලී වූ එක්තරා භික්ෂුවක් උදෙසා බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. ස්ත්‍රීන් පිළිබඳ සිත් නිසා තේජස්වූ පුරාතනයේ නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යසනයට පැමිණීම මින් විදහා දක්වයි.

එහි එන පබවතියගේ චරිතය පාරම්පරික දෘෂ්ටිය නිරූපණය කළද සැබෑ ලෝකයේ ස්ත්‍රියකගේ චිත්ත ස්වරූපයද ඇගේ චරිතය තුළින් විදහා දැක්වෙයි. ඇය අතිශය රූමත් තරු,යකි. සීලවතී මව් බිසවගේ උපාය නිසා විරූපී කුස කුමරු සමඟ විවාහ වන ඇ හට දරු ගැබක් පිහිටන තෙක් දිවා කාලයේ තම සැමියා දැක ගැනීමට නොහැකි වෙයි. එහෙත් කිසිවක් නොකියා ඊට එකඟ වන ඇ තම මව්පියන්ගේ තීරණ වලට එරෙහි නොවූවාය. එකල තිබුණු සම්මතය අනුව දෙමාපියන්ගේ තීරණ වලට එරෙහි නොවීම තුළින් සැබෑ ලෝකයේ ස්ත්‍රියකගේ ස්වාභාවය ඇය තුළින් නිරූපණය වෙයි.

විවාහ ජීවිතය අඹු සැමි යුවලකගේ කායික තෘප්තිය පමණක් නොවේ. ඒ වූ කලී ජීවිතයේ දුක සැප බෙදා ගෙන නින්දා ප්‍රසංශා දරාගෙන ඒවා බෙදා හදා ගෙන ගත කරන සාමූහික සහජීවනයකි. පබාවතියට අවශ්‍ය වූයේ සැබෑ ලෝකයේ ස්ත්‍රියක මෙන් තම විවාහ දිවිය ගත කිරීමටයි. තම ස්වාමියා දහවල් කාලයේ දැක ගැනීමේ ආශාව ඇ තුළ පැනණැගීම ස්වාභාවිකය. එහිදී ඇය රවටනු ලැබුවේ සීලවතී බිසව විසිනි. කුස රජ නෙළුම් පොකුණේ සැඟවී සිට දිය කෙළියට බට පබවතියගේ අත අල්ලා ගත් අවස්ථාවේ ස්පර්ශයෙන්ම ඒ කුස රජු බව වටහා ගන්නා  පබාවතිය වහා කිපී තම නුවර වූ සාගල පුරයට යාමට පිටත් වෙයි. ඕනෑම ස්ත්‍රියක් මෙවන් අවස්ථාවක සිදු කරන්නේ තම මව්පියන්ගේ සහය පැතීමයි. පබාවතියද එලෙස තම මව්පියන්ගේ පිහිට පතා යයි. ඇගේ කිපීම සාමාන්‍ය ලෝකයේ ගැහැනියකගේ හැසිරීමට සමාන හැසිරීමකි.

පබවතිය සිය පුරවරයට ගිය පසුව කුස රජු ඉමහත් චිත්ත පීඩාවට පත්ව ඇය සොයා මද්‍රාපුරයට යයි. එහි ගොස් ඇත්හල සිට වීනා වාදනය කිරීම, කුඹලා හා එක්ව පබාවතීගේ රූපය සහිත වළං සාදා යැවීම,අරක්කැමිකම් කිරීම ආදිය සිදු කරයි. මේ සිදුවීම් කිසිවකින් පබවතියගේ සිත් ගැනීමට කුස රජතුමාට නොහැකි වෙයි. ඒ සියල්ල කෝන්තියෙන් ප්‍රතික්ෂේප කරන පබවතියගේ චරිතය මුරණ්ඩු සැර පරුෂ චරිතයක් ලෙස ජාතක කතාකරුවා නිර්මාණය කර තිබේ. එහෙත් එම හැසිරීමට මුල් වූයේ ඇය රවටා විරූපී රාජ කුමාරයෙකුට ඇය පාවා දීමයි. එලෙස බලන කළ ඇගේ හැසිරීම සාමාන්‍ය ස්ත්‍රියකගේ හැසිරීම මෙන්යැයි සිතිය හැකිය.

> **"මම මෙතැන් පටන් දිවිහිමියෙන් කයින් වචසින් මනසින් අමනාපයක් නො සිතමි, නො කරමි ඉදින් මා මෙසේ යාඥා වෙමින් සිටිය දී මට ක්ෂමා නො කොට මාගේ බස් නො පිළිගත් සේක් වී නම් දැන් මපියාණන් වහන්සේ මෙසත් රජදරුවන්ට මා සත් කඩක් කොට කපා දෙන සේක. එහෙයින් මට ක්ෂමා කොට රැක්ක මැනවැයි යාඥා කළා ය."**

කෙසේ වුවත් කතාව අවසානයේ තමා මරණයෙන් බේරා ගත් උස රජුට දිවි හිමියෙන් ප්‍රේම කිරීමට ඇය තීරණය කරයි. මෙලෙස විවිධ සිදුවීම් වලදී ඇය ගේ හැසිරීම නිරීක්ෂණය කළ විට සැබෑ ලෝකයේ ස්ත්‍රියකගේ හැසිරීම, චිත්ත ස්වාභාවය ඇගේ චරිතය තුළින් විදහා දැක්වෙන බව තීරණය කළ හැක.

Hasitha hettiarachchi
071-9020298

**04. ජාතක කතාකරුවා මිනිසුන්ගේ ගූඪ සිතුවිලි දැන හැඳින ඒවා පාඨකයා හමුවේ ඉදිරිපත් කර ඇති ආකාරය කුස රජුගේ චරිතය ඇසුරෙන් විමසුමට ලක් කරන්න. (ලකුණු 15)**

කුරුණෑගල රාජධානි සමයේ පාලිජාතකට්ඨකතාව ඇසුරු කරගෙන වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ මැදිහත්වීමෙන් සිංහලයට නැගුණු පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ජාතක කතා **547**කින් සමන්විතය. එය කතා **550**ක්ව පැවති බවට ද විද්වත් මතයක් පවතී. එහි එන **523**වන කතාංගය වන කුස ජාතකය ස්ත්‍රියක් නිසා සසුනේ උකටලී වූ එක්තරා භික්ෂුවක් උදෙසා බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. ස්ත්‍රීන් පිළිබඳ සිත් නිසා තේජස්වූ පුරාතනයේ නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යසනයට පැමිණීම මින් විදහා දක්වයි.

මිනිස් සිත තුළ යටපත් වූ ආසාවන්, ගූඪ සිතිවිලි රාගාධික හැඟීම් ආදිය ජාතක කතා වල එන චරිතයන්ගේ හැසිරීම් තුළින් පෙනෙන්නට තිබේ. මෙහි එන කුස රජුගේ චරිතයද එවැනි ගූඪ සිතිවිලි වලින් පිරුණු චරිතයක් බව පෙනෙන්නට තිබේ. බෝධිසත්වයන් වූ ඔහු විටෙක ක්‍රියා කරන්නේ ආත්මාවබෝධයෙන් යුක්තව ය. නිදසුනක් ලෙස තමා විරූපී බව දැනගෙන තමා වෙත ස්ත්‍රීන් නොපැමිණෙන බව වටහාගෙන විවාහය ප්‍රතික්ෂේප කරයි. සිය මව වූ සීලවතී බිසවගේ උපාය අනුව රූමත් කුමාරිකාවක් සොයාගෙන ඒමට තීරණය වීමෙන් පසු රන් රුවක් සාදා එබඳු ලියක් ලදහොත් විවාහ වන්නෙමි යි කීමෙන් ඔහු තුළ පැවති ආත්මාවබෝධය නිරූපණය වේ. එහෙත් පබවතිය හා විවාහයට පසුව දරු ගැබක් පිහිටන තුරු දිවා කාලයේ සැමියා දැකීමක් නැතැයි යන ඔක්කාන රාජ වංශයේ චාරිත්‍රයක් ඇතැයි කියා පබවතිය රවටා ඉන් අනතුරුව කුස රජු ක්‍රියා කරන්නේ ආදරය නිසා උමතු වූ ගූඪ සිතිවිලි ඇත්තෙක් සේ ය.

විවාහය යනු අඹු සැමි යුවලක් රාත්‍රියෙහි එක් වීම පමණක් නොවේ. ඒ වූ කලී ජීවිතයේ සුඛ - දුක්ඛ, ප්‍රීති - ප්‍රමෝද ආදිය සම සිතින් බෙදා හදා ගෙන ගතකරන සාමූහික ජීවිතයකි. පබවතියට මෙන්ම කුස රජුටද අවශ්‍ය වූයේ ප්‍රේමයේ මතුපිට පාවීමට නොව එහි ගැඹුරු අරුත වටහා ගැනීමට යි. ආස්වාදනය කිරීමට යි. කුස රජතුමා දිවා කල පබවතිය නොදැකීමෙන් චිත්ත ව්‍යාකූලත්වයට පත් වූවා සේ ය. මැණියන්ගේ උපායෙන් දිවා කල පබවතිය දකින සෑම අවස්ථාවකම ඔහු ක්‍රියා කරන්නේ ප්‍රකෘති සිහිය රහිත පුද්ගලයෙකු මෙන් ය.

ඇත්හලදී ඇත්බෙට්ටකින් පබවතියට ගැසීම, අස් හලේදී අස් බෙට්ටකින් ගැසීම, ඇතුපිට පශ්චිම ආසනයේ ජයම්පතී කුමරු සමග යන විට ඇයට උසුළු විසුළුකිරීම ආදිය ආලයෙන් අන්ධ වූ තැනැත්තෙකුගේ ගූඪ ක්‍රියා කලාපය නිරූපණය කරයි. මඟුල් උයනේ කරවටක් දියට බැස මුහුණ වසාගෙන සිට පබවතිය දියට පැන කෙළි සෙල්ලම් කරන වේලේ වහා අතින් ඇදීම වැනි සිදුවීම් ඉදිරිපත් කිරීම කතුවරයා විසින් රජුගේ ගූඪ සිතිවිලි තව දුරටත් ඔප්නැංවූවා සේ ය.

පබවතිය සිය පුරවරයට ගිය පසුව කුස රජු ඉමහත් චිත්ත පීඩාවට පත්ව ඇය සොයා මදුරාපුරයට යයි. එහි ගොස් ඇත්හල සිට වීනා වාදනය කිරීම, කුඹලා හා එක්ව පබාවතීගේ රූපය සහිත වළං සාදා යැවීම, අරක්කැමිකම් කිරීම ආදිය සිදු කරයි. මේ සිදුවීම් කිසිවකින් පබවතියගේ සිත් ගැනීමට කුස රජතුමාට නොහැකි වෙයි.

කෙසේ වුවත් කතාව අවසානයේ තමා මරණයෙන් බේරා ගත් කුස රජුට දිවි හිමියෙන් ප්‍රේම කිරීමට පබවතිය තීරණය කරයි. බෝසත් වුව ද අමා මහ නිර්වාණ සම්පත්තිය නොලැබූ තැනැත්තෙකු වන කුස රජු පෘතග්ජන මිනිස් ගති වලින් සම්පූර්ණයෙන් තොර නොවූ චරිතයක් සේ නිරූපණය කර ඇති බැවින් ජාතක කතා කරුවා විවිධ චිත්තාභිලාෂ හා අභියෝග හමුවේ මිනිස් සිත ක්‍රියා කරන ගූඪ ලක්ෂණ කුස චරිතයෙන් මෙලෙස සාර්ථකව නිරූපණය කර ඇති සෙයක් පෙනේ.

Hasitha hettiarachchi
071-9020298

**සිංහල සාහිත්‍ය රසාස්වාදය**

**10 ශ්‍රේණිය**

**කුස ජාතකය**

කුස ජාතකය ඇසුරිනි.

(01)ජාතක කතා පොත සිංහලයට නැඟුණු යුගය කුමක්ද?කුරුණෑගල යුගය

(02)කුමන රජතුමාගේ කාලයේදී ද?සතරවන පැරකුම් රජතුමාගේ කාලයේ දී.

(03)අනුග්‍රහය දැක්වූ අමාත්‍යවරයා කවුද?වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යවරයා.

(04)"කුස ජාතකය" ජාතක පොතේ කීවෙනි කතාංගයද?523 වන කතාංගය

(05)ජාතක කතාවක දැකිය හැකි ආකෘතික අංග 3 නම් කරන්න.

01.අතීත කතාව

02.වර්තමාන කතාව

03.සමෝධානය

(06)කුස ජාතකයට අයත් වර්තමාන කතාව කුමක්ද?සර්භාවරණයෙන් විභූෂිත වූ එක් මාතුගාමයකු දැක ශාසනයෙහි උකටලී වූ භික්ෂුවක් සැවැත්නුවර ජේතවන විහාරයේ වාසය කිරීම.

(07)සමෝධානයට අයත් කොටස ලියන්න."එකල මවුපිය දෙදෙන සුධෝදන රජ්ජුරුවන් හා මහමායා දේවී වූහ.ජයම්පති කුමාරයෝ නම් ධර්මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයෝ වූහ.එසමයෙහිකුදුත් දැන් ඛුජ්ජුන්තරා නම් භික්ෂුණී වූහ.ප්‍රභාවතීතොමෝ රාහුල ස්ථවිරයන්ට මවු බිම්බාදේවි වූය,එසමයෙහි රජ පිරිස් දැන් බුදු පිරිස් විය.ප්‍රභාවතී නිසා සත්මසක් දුක්ගෙන සත් රජුන් මන්මැඩ සෙමෙහි තබා ප්‍රභාවතීන් නම් තිලෝගුරු බුදු වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක."

(08)අතීත කතාව කුමක්ද?ලිහිල් බසින් ලියන්න. පෙර කාලයේදී මලල රට කුසාවතී නුවර ඔක්කාත නම් රජෙක් දැහැමින් රට පාලනය කළේය. .අගමෙහෙසිය සීලවතී බිසවයි.ඔහුන්ට කුස හා ජයම්පති නමින් කුමාරයෝ දෙදෙනකු ඉපදුනා.කුස කුමරු තේජවන්ත කුමාරයෙක්.කුස කුමරු තරුණ වියෙහි පබාවති කුමරියව විවාහ කර ගත්තා .නමුත් ඒ සඳහා සීලවතී බිසවට උපායශීලී ව කටයුතුකිරට සිදු වුනා .ඒ කුස කුමරු විරූපී ව ඉපදීම නිසයි.දවල් කාලයේදී කුස කුමරුට හා පබාවති කුමරියට ඔහුනොවුන් මුණ ගැසිම තහංනම් වුනා .ඔය අතර කුස කුමරුට පබාවති කුමරිය ව දහවල් කාලයේදී දැක ගැනිමට ආශාවක් ඇති වුනා .සීලවතී බිසවගේ උපක්‍රම යෙන්ඇයව දැක ගැනිමට හැකි වුනා .නමුත් එක් දිනක නෙළුම් පතකින් මුහුණ වසාගෙන සිටි කුස රජුගේ විරෑපී මුහුණ දුටුවා.එසේම තමාව රවටා ඇතිබවද දැනගෙන මාලිගයෙන් තම මවුරට වූ මදුරටේ දෙමව්පියන් ළඟට පැමිණියා.දැඩි ආදරය නිසා කුස කුමරු අවුරුදු හතක් බැල මෙහෙවර කරමින් පබාවතී දැන ගැනීමට වෙහෙස වුනා.පසුව ශක්‍රයාගේ මැදිහත් වීමෙන් සත් රජවරු පබාවතිය රැගෙන යාමට පැමිණි අවස්ථාවේදී ඇය සත්කඩකට කපා ඔවුන්ට දෙන තීරණය අසා කුස රජු ඉදිරිපත් වී පබාවතියට සමාව දී යලි කුසාවතී නුවරට රැගෙන ගියා.කුසගේ විරූපී මුහුණ නැවත සුරූපී බවට පත් වුනා.

**3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය**

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1